රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 21/2015

මගේ අංකය : EST/7/04/LON/0202
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2015.08.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය සංශෝධනය කිරීම</u>**

**<u>උත්සව අත්තිකාරම්</u>**

ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13 වගන්තිය කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එකී වගන්තියේ 13:2 සහ 13:5 උප වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමට 2015.06.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

13:2. නිලධරයාගේ කැමැත්ත පරිදි ඕනෑම එක් වාර්ෂික උත්සවයක් සඳහා රු. 10,000/- ක අත්තිකාරම් මුදලක් ලබා දිය හැකිය. 3:5 උප වගන්තියේ සඳහන් මුදල් අඩුකර ගත හැකි සීමාවන් මෙම අත්තිකාරම් මුදලට අදාළ නොවේ.මෙම අත්තිකාරම් මුදල පොලී රහිතය.

13:5. මෙම අත්තිකාරම් මුදල මාසික කොටස් අටකින් (08) හෝ අවශ්‍ය වුවහොත් ඊට කලින් හෝ අයකර ගත යුතුය. මුළු මුදලම අයකර ගෙන අවසන් වීමට පෙර නිලධරයාගේ සේවය අවසන් කරනු ලැබුවහොත්, රජයට අයවිය යුතු ණයතුරුස් කිසිවක් වේ නම් ඒවා ද සමඟ මෙම අත්තිකාරම් මුදලෙන් අයකර ගැනීමට ඉතිරිව ඇති ශේෂය, ඔහුට ගෙවීමට ඇති යම් මුදලකින් මුලින්ම අයකර ගත යුතුය. එසේ සේවය අවසන් වන්නේ යැයි බලාපොරොත්තු විය හැකි අවස්ථාවකදී, සේවය අවසන් වීමට කලින් මුළු අත්තිකාරම් මුදලම අයකර ගත හැකි වන පරිදි අයකර ගැනීමේ වාරික ගණන අඩු කළ යුතුය.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය